අබූ සලමා (රඩියල්ලාහු අන්හු)ගේ වාර්තාවට අනුව, "සමහර අය අබූ බක්ර් (රඩියල්ලාහු අන්හු) වෙත පැමිණ 'ඔබේ මිතුරාට ඔබ සවන් දුන්නේද?' ඔහු එක රැයකින් ජෙරුසලමට ගොස් ආපසු පැමිණියේ යයි කියයි. එවිට වහාම අබූ බක්ර් (රඩියල්ලාහු අන්හු)ගේ පිළිතුරු වූයේ, "ඔහු මේ බව සඳහන් කළේය නම්, එය නියත වශයෙන්ම සත්‍යයකි." යයි පැවසූහ.

තවද, ඔවුන් ඔහුව බලකර මෙසේ විමසූහ, "එක් රැයකින් සඳහන් කළ සියලු ස්ථාන වෙත ගොස් අළුයමට පෙර ඔහු පැමිණි බව ඔබ විශ්වාස කරනවාද?" එවිට අබූ බක්ර් (රඩියල්ලාහු අන්හු) තුමාගේ පිළිතුර වූයේ, " ඔව් ඇත්ත, මම ඔහුව ඉන් ඔබ්බටද විශ්වාස කරමි. දිවා රාත්‍රී දෙකෙහිම ඉතා දුර අහස්තලයේ සිට පණිවිඩ ඔහුට ලැබෙන බව විශ්වාස කරමි" යි පැවසූහ. මෙම සිද්ධිය අබූ බක්ර් (රඩියල්ලාහු අන්හු) තුමාට "අස්-සිද්දීක්" අර්ථය තරයේ විශ්වාස කරන්නා, යන නිලනාමය ලැබීමට ඉවහල් විය

ඉස්රා වල් මිඃරාජ් සිද්ධිය ආදර්ශයන් අතරින් අවධානයට යොමුකළ යුතු කරුණක් වන්නේ, උතුම් සාරධර්ම වන අවංකභාවය හා එක්සත්කම ජනතාව තුල සුරක්ෂිත කිරීමය. ඉස් රා වල් මිඃරාජ් සිද්ධියේ ආදර්ශයන් අතර ප්‍රධාන වශයෙන් අවධානයට යොමු කල යුතු කරුණ නම් උතුම්වූ සාරධ ර්ම වන අවංකකම සහ එක්සත්කම ජනතාව තුල සුරක්ෂිත කිරීමය මෙම හේතුව නිසා, අප හෝ අපගේ සමාජයට යම් වචනයකින් හෝ ක්‍රියාවකින් හානියක් නොවන පරිදි ක්‍රියා කිරීම අප සියලු දෙනාගේම වගකීමක් බව, අති උත්තම අල්ලාහ් නියෝග කළේය.

මොවුන් අල්ලාහ්ගේ ප්‍රීතිය පතන අවංක විශ්වාසවන්තයන්ගේ ගණයට අත් වේ.


P.O Box: 16090, Al Ain, U.A.E
www.zhic.ae contact@abudhabi.ae

zhic.uae @zhic_uae zhic_uae

800 555 اتصل على JUST CALL



دار زايـد للثقافـة الإسلاميـة
Zayed House For Islamic Culture


# الإسراء والمعراج

## اللغة السنهالية

# ඉස්රා වල් මිඃරාජ් සිද්ධිය

අල්ලාහ් තම වක්තෘ වන මුහම්මද් නබි (සල්) තුමාගේ ගුණාත්මකභාවය තහවුරු කිරීමට විවිධ වරප්‍රසාද ප්‍රධානය කළේය. ඉස්රා වල් මිඃරාජ් යන ආශ්චර්යමත් සිද්ධිය සහ අල්ලාහ් තම වක්තෘවරයා වෙත විශේෂත්වයක් දැක්වූ එක් සාක්ෂියකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි, “එකම රාත්‍රියක් තුළ තම ගැත්තාව, ඔහුට අපගේ සංඥාවන් පෙන්වීම සඳහා, (මක්කාහ්වේ) මස්ජිදුල් හරාමයේ සිට එහි වටාපිටාව අප විසින්ම ආශිර්වාද කර තිබුණු (ජෙරුසලමේ) මස්ජිදුල්-අක්සා (දුරබැහැර දෙව්මැදුර) දක්වා රාත්‍රි කාලයේ ගෙන ගිය ඔහු (අල්ලාහ්) ඉඳුරා සුවිශුද්ධය. නියත වශයෙන් ඔහු සර්ව ශ්‍රාව්‍යය. සර්ව දෘෂ්ටිකය.”(අල්-ඉස්රා:1)

මෙම සිද්ධිය සිදුවුයේ, මුහම්මද් නබි (සල්) තුමා හට මුහුණ දීමට සිදුවූ කටුක අත්දැකීම් වන තායිෆ් සහ මක්කාවේ ජනතාවගෙන් ඔහුවෙත එල්ල වූ කරදර හිංසාකාරි පීඩාවෙන් අනතුරුව සහ ඔහුට ප්‍රබල සහාය ලබාදුන් ඔහුගේ හදවතට සමීපවත් අබූ-තාලිබ් සහ ඔහුගේ ප්‍රිය භාර්යාව වූ කදීජා (රදියල්ලාහු අන්හා) තුමියගේ අභාවයෙන් පසුවය.

උත්තතරීතර වූ අල්ලාහ් තම වක්තෘ වන මුහම්මද් නබි (සල්) තුමාව ශුද්ධ වූ මක්කාහ්වේ මස්ජිදුල් හරාමයේ සිට ජෙරුසලමේ මස්ජිදුල්-අක්සා වෙත විශ්මිත රාත්‍රි කාලයේ රැගෙන ගියේය. මෙම ගමනේදී අහස් තලය ඉක්මවා අල්ලාහ්ගේ අබියසට කැඳවූ අතර සත්‍යය සහ උදාර වූ මැවීම් සියැසින් දැක ගැනීමට මෙන්ම, විඳින ලද වේදනාවන් සහ ශෝකය මඩැ පැවැත්වීමට ප්‍රතිඋපකාරකයක් සහ අධිෂ්ඨානාත්මක ශක්තියක් ලබා දීමට ඉවහල් වූ ශ්‍රේෂ්ඨතම ගමනක්ම විය.

ඔහු (සල්) තුමා අල්-බුරාක් නමැති සත්වයා පිට නැගී ජෙරුසලම වෙත රැගෙන, සියලු වක්තෘවරුන් රැස්කරවා සමූහ සලාතයක් මෙහෙයවීමට මුහම්මද් නබි (සල්) තුමාට වරප්‍රසාදයක් ඔහුට ලබා දුන්නේය. මුහම්මද් නබි (සල්) තුමා මෙම සිද්ධිය මෙසේ විග්‍රහ කලේය. "මා දුටු වක්තෘවරුන් සමූහය අතර මාද සිටියෙමි..... සලාතයට නියමිත වූ කාලය උදා වූ අවස්ථාවේ මම සලාතය මෙහෙය වූයෙමි"

සලාතය මෙහෙයවන්නා ලෙස මුහම්මද් (සල්) තුමා පත්කිරීම මගින් පෙන්නුම් කරන්නේ ඔහුවෙත පිරිණැමූ ඉහළ නිලයයි. උතුම් ගුණාංග වන සලාතය මෙහෙයවීම සහ සාමූහික සලාතයට සහභාගි වීමේ වදගත්කම පෙන්නුම් කරයි. මෙම ගමන මස්ජිදයෙන් ආරම්භ වී මස්ජිදයෙන්ම අවසන් වූයේය. මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන අනන්‍යතාවය වන මස්ජිදය දෛනික ජිවිතයේ සන්නිවේදන මාර්ගයක් වන අතර එය නඩත්තු කිරීමට වෙහස වීම අනිවාර්ය වේ. මෙම කරුණු නිසා, කෙනෙකුගේ හදවත මස්ජිදය සමග සම්බන්ධව සිටන්නේ නම්, දුක්ඛිත විනිශ්චය දිනයේදි, එම පුද්ගලයාගේ හදවත හා ඇස් පීඩාවෙන් සුරක්ෂිත වන්නේය.

අනස් බින් මාලික් (රදියල්ලාහු අන්හු) තුමා මෙසේ විස්තර කරන ලදී. අබූදර් (රදියල්ලාහු අන්හු) ගේ වාර්තාව අනුව, මෙම රාත්‍රී ගමන පිළිබඳ මුහම්මද් නබි (සල්) තුමා මෙසේ පැවසුවේය, "ජිබ්රීල් ඔහු මගේ අත අල්ලා ආසන්නම අහස්තලය වෙත ළඟාවූවේය. මා අහස්තලය වෙත ළඟාවූවිට, ජිබ්රීල් (අලෛයි) අහස්තලයේ දොරටුපාලක වෙත "දොරටුව විවෘත කරන්න" යයි ඉල්ලීමක් කළේය. එවිට දොරටුපාලක 'ඔබ සමග තවත් කෙනෙක් සිටින්නේ දැයි විමසුවේය. එවිට ජිබ්රීල් (අලෛයිහි සලාම්), "ඔව්, මුහම්මද් මා සමග සිටින" බව පැවසීය. එවිට "ඔහුට ආරාධනාවක් තිබේ" දැයි විමසුවේය. "එසේය" යයි පැවසූ සැනින් අහස්තලයේ දොරටුව විවෘත විය.

මෙම හදීසය දැනුම් දෙන අනස් (රදියල්ලාහු අන්හු) තුමා මෙසේ පැවසීය: ‘අහස්තලයන්හී ආදම්, ඉද්රීස්, මූසා, ඊසා, ඉබ්රාහීම් (අලෛයිහිම් සලාම්) යන වක්තෘවරුන් මුණ ගැසූ බව, නබි (සල්) තුමාණෝ සඳහන් කළහ. අවසානයේදී, නබි (සල්) තුමා අහස්තලයේ උච්චතම ස්ථානයට ළඟාවූ විට, එම අවස්ථාව පිළිබඳ අල්ලාහ් මෙසේ පවසයි. “නියතවශයෙන් (නබිවරයා) තවත් වතාවක් ඔහු දුටුවේය. සිද්රතුල් මුන්තහාව (ගස) අසල. ඒ අසලම ජන්නතුල් මඃවාද. වෙලාගන්නාවූ දේ සිදරාහ්ව වෙලාගත් කල්හි. (ඔහුගේ) දර්ශනය ඉවත නොවීය. තවද සීමාව නොඉක්මවීය. නියතවශයෙන් ඔහු තම රබ් (පරමාධිපති)ගේ ශ්‍රේෂ්ඨතම සංඥාවලින් සමහරක් දුටුවේය.” (අන්-නජ්ම්: 13-18).

නබි (සල්) තුමා දුටු දර්ශනවලින් එක් දර්ශනයකි, ඕපාදූප සහ කේළාම් කියන්නන්ගේ දර්ශනය. ඔහු මෙසේ පැවසූහ, "මිඃරාජ් රාත්‍රියේදි මා එක්තරා මිනිස් සමූහයක් දුටුවෙමි. ඔවුන්ගේ ළැම පෙදෙස සහ මුහුණ තඹ ඇණවලින් පහුරු ගාමින් සිටියහ. එවිට " ඕ ජිබ්රීල්, මොවුන් කවුරුන් දැයි?" විමසුවෙමි: එයට ජිබ්රීල්ගේ පිළිතුර වූයේ, මොවුන් අන් අයගේ මාංශ අනුභව කරන සහ මිනිසුන්ගේ කීර්තියට නිග්‍රහ කළ අයයි."

මෙම හදිසය අපහට කරන මතක් කිරීමක් මෙන්ම, ඕපාදූප කතාකිරීම, කේළාම් කීම සහ අපහාස කිරීම වැනි බරපතල ක්‍රියාවලින් වැළකී සිටීම සහ එයින් සමාජයට වන අයහපත් ප්‍රතිවිපාක වටහා ගැනීමය.

අහස්තලයට ගිය ගමනේදී, දෛනික සලාතය අනිවාර්ය කළ බව මුහම්මද් නබි (සල්) තුමා මෙසේ පැවසූහ. "අල්ලාහ් මා හට නියම කළේ පනස් වතාවයි. මා ආපසු අල්ලාහ් වෙත ගොස් යටහත්ව එය අඩුකරන ලෙස ඉල්ලා සිටියෙමි. අල්ලාහ් මාගේ ඉල්ලීම පිළිගෙන එය පස් වතාවක් දක්වා අඩු කළේය. නමුත් එහි ප්‍රතිඵලය පනස් වතාවකට සමානය. මගේ කියමනෙහි කිසිම වෙනස් වීමක් වන්නේ නැතැ”යි අල්ලාහ් පැවසුවේය.

සලාතයෙහි උසස් තත්වය සහ එහි වැදගත්කම මෙන්ම එය අනිවාර්යෙන් පිළිපැදීමේ වැදගත්කම මෙම හදීසයෙන් තහවුරු වේ. අති උත්තම අල්ලාහ් තවදුරටත් එහි ගුණාංගය මෙසේ තහවුරු කලේය: "නියත වශයෙන්ම සලාත් වනාහි විශ්වාසවන්තයන් (මුස්ලිම්වරුන්) විසින් නියමිත වේලාවන්හිදී ඉටුකල යුතු අනිවාර්ය යුතුකම වේ." (අන්-නිසා:103) සැබවින්ම, කවරෙකු නියමිත වේලාවට කැපවීමකින් අල්ලාහ්ගේ ප්‍රීතිය පතා අනිවාර්ය සහ විකල්ප සලාතය ඉටුකරන්නේද, ඔවුන් ජයග්‍රහකයන් ය. මෙමගින් තමන්ගේ අඩුපාඩුකම් වටහා පිරිමසා ගැනීමෙන්, මැවුම්කරු වෙත තව තවත් ළඟාවීමෙන්, ස්වර්ගයට ඇතුළු විය හැක.

අපගේ උතුම් ගුරුවරයා වන මුහම්මද් නබි (සල්) තුමා මෙසේ පැවසූහ. "විනිශ්චය දිනයේදී මිනිසුන්ගෙන් අසනු ලබන පළමු ප්‍රශ්නය වන්නේ සලාතයයි. අල්ලාහ් දේවදූතයන්ගෙන් මෙසේ විමසයි," මාගේ ගැත්තා නියමාකාරව ඉටු කළේද නැද්ද? නිසි ආකාරයට ඉටු කළේ නම්, එය නියමාකාරව කළ බව සඳහන් වේ. එය නිසි ආකාරයට ඉටු නොකළේ නම්, දේවදූතයන්ගෙන් මෙසේ පවසයි, 'එය නියමාකාරව නොකළ බවයි, එවිට අපගේ පරමාධිපති විසින් මෙසේ පවසනු ලබයි. " නිර්දේශිත සලාතයන් ඉටුකර තිබේනම්, එය අනිවාර්ය සලාතය සමග හිලවු කරනු යැයි දන්වනු ලබයි. මෙහිදී මිනිසුන්ගේ සියලූම ක්‍රියාවන් සමානාත්මකව සලකනු ලැබේ.

උතුම්වූ මෙම රාත්‍රී ගමන පිළිබඳව නබි (සල්) තුමා ඔහුගේ මිනිසුන්ට විස්තර කළ අවස්ථාවේදී ඔවුන් අතර සිටි සමහරුන් විශ්වාස නොකළ අතරම ඔහුගේ වක්තෘ තනතුර අපකීර්තියට පත් කළහ. තවද, ඔවුන් එම ප්‍රකාශ තහවුරු කරන ලෙස අභියෝග කළහ. ඒ නිසා ඔහු එම ස්ථානය පිළබඳව සෑම මුල්ලකට හුරු පුරුදු වූ කෙනෙකු ලෙස ජෙරුසලම හා එහි මං සලකුණු ඔවුන්ට විස්තර කළහ. මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඔහු මෙසේ පැවසූහ." කුරෛයිෂ්වරුන් මාගේ මෙම උතුම් රාත්‍රී ගමන විශ්වාස නොකළ අවස්ථාවේදී, මා අල්-හිජ්ර් (ගල)හී මත නැගී සිටගත් සැනින් අල්ලාහ් ජෙරුසලම මා ඉදිරිපිට ප්‍රදර්ශනය කළේය. මම එය දෙස බලා ඔවුන්ට විස්තර කළෙමි. අති උත්තම අල්ලාහ්, උන්වහන්සේගේ අනාවැකිය පැවරූ තම වක්තෘවරයාව තහවුරු කළ අතරම ඇදහිලිවන්තයන්ට 'ඇදහිල්ල සහ විශ්වාසය තවදුරටත් ශක්තිමත් කර ගැනීම උදෙසා මෙම හදීසය පහල කලේය.